ඔබ අතුරින් කිසිවකුගේ පාවහන් පටිය කැඩී ගිය විට එය සකසා ගන්නා තෙක් අනෙක් පාවහන පැළඳ ගමන් නොකළ යුතුය.

අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා කළ ප්රකාශයකට තමන් සවන් දුන්
බව අබූ හුරෙය්රා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. “ඔබ අතුරින් කිසිවකුගේ පාවහන් පටිය කැඩී ගිය විට එය සකසා ගන්නා තෙක් අනෙක් පාවහන පැළඳ ගමන්
නොකළ යුතුය.“
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

තම පාවහන කැඩී, එය පැළඳ ගමන් කිරීමට නොහැකි තත්ත්වයක් උදා වූ විටක, එක් පාවහනක් පමණක් පැළඳ ගමන් කිරීමෙන් නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වැළැක්වූහ. පළුදු වූ දෑ සකසා ගැනීම හෝ අනෙක ගලවා පාවහන් නොමැතිව ගමන් කිරීම ඔහු අනුගමනය කළ යුතු වේ.

http://www.sunnah.global/hadeeth/si/show/8907